සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
# Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ....................................................................................... විභාග අංකය :- ...........................

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) ඔබේ පාසලේ ඉතිහාසය දැනගැනීමට උපකාරීවන මූලාශ්‍රයකි.
(1) පාසලේ භූමි ප්‍රමාණය
(2) පාසලේ නම
(3) පාසලේ විවිධ ස්ථානවල ඇති සමරු ඵලක
(4) පාසලේ ගොඩනැගිලි සංඛ්‍යාව

(02) ඔබ සුවිශේෂී පුද්ගලයෙකි. ඔබට සමාන කිසිවෙක් මෙලොව නැත. ඔබ ඔබම විය යුතුය. ඒ ඔබගේ,
(1) ආත්මාභිමානයයි. (2) අනන්‍යතාවයයි.
(3) ආත්ම ගෞරවයයි. (4) ආත්ම විශ්වාසයයි.

03) නිදහස් අධ්‍යාපනයේ පියා යන නාමයෙන් පිදුම් ලැබුවේ.
(1) සී.ඩබ්ලිව්.ඩබ්ලිව් කන්නන්ගර මැතිතුමාය. (2) ආතර්.වී.දියෙස් මැතිතුමාය.
(3) සිරි ගුණසිංහ මැතිතුමාය. (4) ඊ.ඩබ්ලිව් අදිකාරම් මැතිතුමාය.

(04) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක් එක්වී ගොඩනැගෙන පරිපාලන ඒකකය වන්නේ.
(1) ග්‍රාම නිලධාරි කොට්ඨාස යි. (2) දිස්ත්‍රික්කය යි.
(3) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යි. (4) පළාතයි.

(05) A උප්පැන්න සහතික නිකුත් කිරීම.
B ජලමාර්ග ප්‍රතිසංස්කරණය හා කැළි කසළ ඉවත්කිරීම.
C ග්‍රාම සේවා සහතිකයට අනුමැතිය ලබාදීම.
D පුස්තකාල, ක්‍රීඩා භූමි, උද්‍යාන, පවත්වාගෙන යාම.
E විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළ කටයුතු කිරීම.
ඉහත ප්‍රකාශ වලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉටුවන සේවාවන් පෙන්වන අක්ෂර කාණ්ඩය ඇතුළත් පිළිතුර කුමක්ද?
(1) A,B,C (2) B,D,A (3) C,B,D (4) A,C,E

Department of Education – Western Province

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රකාශන නිවැරදි නම් ''✓'' ලකුණ ද, වැරදි නම් ''×'' ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

(06) ආත්මාවබෝධය යනු තමා තමන් ව තේරුම් ගැනීමයි. ( )

(07) ඖෂධවේදය පිළිබඳ මෙරට ප්‍රථම මහාචාර්ය වරයා වූයේ වෛද්‍ය නන්දදාස කෝදාගොඩ ය. ( )

(08) අභියෝග ජයගත් පුද්ගලයන් ලොව සාර්ථක පුද්ගලයන් බවට පත්ව ඇත. ( )

(09) පාසලක පවත්නා නීතිරීති සම්ප්‍රදායන් පාසල් සංස්කෘතියට අයත් නොවේ. ( )

(10) සක්‍රීයව සවන් දීමෙන් දෙනු ලබන පණිවිඩය නිවැරදි ලෙස අවබෝධ කරගනියි. ( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරැදි පිළිතුර දී ඇති වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

(සම්ප්‍රදායයන්, රීති, යුතුකමක්, දුර්වලතා, පරිසරය, නිර්මිත, අරමුණු)

(11) ඔබ තුළ පවතින .............................. අන් අය පෙන්වා දීමට පෙර ඔබ ම ඒවා හඳුනා ගැනීමට උත්සාහ කළ යුතුය.

(12) පාසල් ශිෂ්‍යයකු ලෙස ඔබ ජීවිතයේ සාර්ථකත්වය උදෙසා උදාර .............................. ඇති කරගත යුතුය.

(13) අතීතයේ සිට පැවත එන සමාජ සම්මතයන් .............................. ලෙස හැඳින්වේ.

(14) පොදු දේපළ ආරක්ෂා කිරීම අප සැමගේ වගකීමක් හා .............................. වේ.

(15) මිනිසා විසින් ස්වභාවික පරිසරය තුළ නිර්මාණය කරන ලද දෑ .............................. පරිසරයට අයත් වේ.

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරා යා කරන්න.**

(16) සැලසුම් සහගත ශිෂ්‍යයා — A ළමා මිතුරු පාසල් පරිසරයක දැකිය හැකි ලක්ෂණයකි.

(17) ශ්‍රී ලංකාව — B කාලය උපරිම ලෙස ප්‍රයෝජනයට ගනී.

(18) සුරක්ෂිත ඉගෙනුම් පරිසරය. — C සිද්ධස්ථාන මගින් සිදුවන සේවාවකි.

(19) කොළඹ, කළුතර, ගම්පහ යන දිස්ත්‍රික්ක. — D පළාත් නවයකින් යුක්තවේ.

(20) අධ්‍යාත්මික ගුණ වගාව වර්ධනය කර ගැනීමට උපකාරී වේ. — E බස්නාහිර පළාතට අයත් වේ.

(ලකුණු 2 x 20 = 40)

Department of Education – Western Province

## II පත්‍රය

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්යයි. පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4 ක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(01) (1) පාසල් සංවිධාන ව්‍යුහය තුළ ඇති වෙනත් සංවිධාන දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) ශිෂ්‍ය ශිෂ්‍යාවන් සම්බන්ධයෙන් පාසලක පවතින පොදු නීති දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(3) පාසල් ශිෂ්‍යයකු ලෙස ඔබ සතු අයිතිවාසිකම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(4) පාසල තුළින් ඔබට සැලසෙන සේවාවන් දෙකක් ලියන්න. (ලකුණු 02)

(5) පවුල තුළ දී විනය හා ශික්ෂණය සඳහා පවත්වා ගත යුතු ජීවන පුරුදු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(6) ජලය අපට සම්පතකි. පාසල් ශිෂ්‍යයකු ලෙස පාසල තුළදී ජල සම්පත නාස්ති වීම වැළැක්වීම සඳහා ඔබට දායක විය හැකි ආකාර දෙකක් ලියන්න. (ලකුණු 02)

(7) පොදු දේපලවල දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(8) දේශීය සංස්කෘතියට අයත් දේවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(02) (1) පාසලකට නිති පද්ධතියක් අවශ්‍ය වීමට හේතු දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) පාසලක අනන්‍යතාව පිළිබිඹු කරන සංකේත හතරක් නම් කරන්න. (ලකුණු 04)

(3) පාසල් ශිෂ්‍යයකු / ශිෂ්‍යයාවක ලෙස ඔබේ අයිතිවාසිකම් හා හැකියා වර්ධනය කර ගැනීමට රජය මගින් සපයා ඇති පහසුකම් පහක් දක්වන්න. (ලකුණු 05)

(03) (1) භෞතික සම්පත් බෙදිය හැකි කොටස් දෙක නම් කරන්න. (ලකුණු 02)

(2) භෞතික සම්පතක් ලෙස භූමිය ඵලදායිව යොදා ගත හැකි ආකාර හතරක් ලියන්න. (ලකුණු 04)

(3) භෞතික සම්පත් සංරක්ෂණයට ගත හැකි ක්‍රියාමාර්ග පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

(04) (1) මිනිසා මානව සම්පතක් බවට පත්වීමට බලපානු ලබන සාධක දෙකක් ලියන්න. (ලකුණු 02)


(2) පහත ABCD ඡායාරූප වලින් දැක්වෙන මානව සම්පත් හඳුනා ගෙන නම් කරන්න.




**A**



**B**



**C**



**D**

(ලකුණු 04)

(3) මානව සම්පත විධිමත්ව පුහුණු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන පහක් ලියන්න. (ලකුණු 05)

Department of Education – Western Province

(05) (1) ඔබ අසල්වාසීන් හා ප්‍රදේශවාසීන් සමග සහයෝගයෙන් කටයුතු කරන අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) එසේ සාමූහිකව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(3) පහත දක්වා ඇති රජයේ නිලධාරීන්ගෙන් සිදුවන එක් සේවාව බැගින් ලියන්න.

1. ග්‍රාම නිලධාරි
2. ගුරුවරයා
3. පොලිස් නිලධාරියා
4. තැපැල් කරු
5. මහජන සෞඛ්‍ය පරීක්ෂක (ලකුණු 05)

(06) (1) ඔබ ජීවත්වන ප්‍රදේශයේ ඇති සමිති දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) ඔබ විසින් සඳහන් කරන ලද සමිති දෙකෙන් ජනතාවට සිදුවන සේවාවන් දෙකක් ලියන්න (ලකුණු 04)

(3) ඔබ ප්‍රදේශයට සේවා සපයන ආයතන මගින් ඔබට ඉටු විය යුතු යුතුකම් දෙකක් හා එම ආයතනවලින් සේවා ලබන ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් තුනක් ලියන්න. (ලකුණු 05)

(07) (1) ආචාරශීලී කථනයක දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) ආචාරශීලී ලෙස භාෂාව භාවිතයෙන් ලැබෙන යහපත් ප්‍රතිඵල හතරක් සඳහන් කරන්න. (ලකුණු 02)

(3) ආචාරශීලී බවින් තොර භාෂා භාවිතයෙන් ඇතිවිය හැකි අයහපත් ප්‍රතිඵල දෙකක් ලියා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

Department of Education – Western Province